ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date. 2026.03.23 |
|---|---|---|

එල්.ජී. නුවන් චාමර ප්‍රේමදාස
නො.5/412, ගලහ පාර,
මහකන්ද, හිඳගල.

**පැමිණිලිකාර පාර්ශවය**

1. උප. පො.ප. කපුකොටුව
ස්ථානාධිපති, දූෂණ මර්ධන අංශය
පොලිස් ස්ථානය, පේරාදෙණිය.

2. පො.සැ.37046 ජයතිලක
පොලිස් ස්ථානය,පේරාදෙණිය.

3. පො. සැ. 19208 රුවන්
පොලිස් ස්ථානය, පේරාදෙණිය.

4. ප්‍ර.පො.ප. ඩබ්. එම්. එස්. වී. බී. විජේකෝන්
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, පේරාදෙණිය.

**වගඋත්තරකාර පාර්ශවය**

**පැමිණිලි අංකය: HRC/KND/348/24 - I**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම.**

පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ තමා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කම්කරුවෙකු ලෙස සේවය කරන බවත්, තමාට පාසල් යන දරුවන් තිදෙනෙකු සිටින බවත්, තම බිරිඳට රැකියාවක් නොමැති බවත්, ආර්ථික අපහසුතා ඇති බැවින් ගම්වාසින්ගේ විවිධ කුලී වැඩ කරමින් අමතර මුදල් උපයාගන්නා බවත්, 2024 වර්ෂයේ මැයි මාසයේ දිවයිනේ විශ්ව විද්‍යාල වල අනධ්‍යයන කාර්ය මණ්ඩලවල පැවති වැඩ වර්ජන සමයේ තමා හට මෙම පැමිණිල්ලේ සඳහන් සිදුවීමට මුහුණ පෑමට සිදුවූ බවත් ය. එම වැඩ වර්ජනය හේතුවෙන් තම වැටුප් අහිමි වීම නිසා තමා ප්‍රදේශයේ කුලී වැඩ කරමින් ජීවත් වූ බවත්, 2024.06.01 දිනද තමා උදේ සිටම ප්‍රදේශයේ ස්ථාන කිහිපයක අඹ කඩා විකුණූ බවත්, එදින රාත්‍රී ආහාරය සඳහා පරිප්පු රැගෙන ඒම සඳහා ප.ව.6.15ට පමණ නිවස ආසන්නයේ ඇති කඩයට ගොස් පරිප්පු ග්‍රෑම් 250ක් හා බිස්කට් පැකට් එකක් රැගෙන ප.ව.6.45 - 7.00


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04.<br>இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04.<br>No. 14, R.A.De Mel Mawatha, Colombo -04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011- 2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011- 2505541/74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrcsl@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 /82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011- 2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

ට පමණ තමා රැගෙන ගිය විදුලිපන්දම ද දල්වාගෙන නිවසට පැමිණි බවත්, එලෙස නිවසට එන අතරමග 7 කණුවේ පාලම අසලදී පොලිස් නිලධාරීන් තිදෙනෙකු තමා ළඟට පැමිණ තමා මත්කුඩු රැගෙන ඒමට පැමිණියායි සැකකර අත්අඩංගුවට ගත් බවත්, එම නිලධාරීන් විසින් තමාගේ දෑතට මාංචු දැමූ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

එම අවස්ථාවේදී තමා කඩයට ගියේ රාත්‍රී ආහාරය සඳහා පරිප්පු රැගෙන ඒමට බව පවසමින් කඩෙන් ගත් පරිප්පු සහ බිස්කට් පෙන්වූවද ඒවා පිළිබඳව කිසිදු සැළකිල්ලක් නොදක්වා පොලීසියට ගොස් පෙර වැරදි තියෙනවාද යන්න පරීක්ෂා කර නිවසට එවන බවට දැනුම් දී පොලිස් නිලධාරීන් පැමිණ තිබූ ත්‍රිරෝද රථයෙන් තමාව පේරාදෙණිය පොලිස් ස්ථානය වෙත රැගෙන යන ලද බවත්, එලෙස යන අතරතුරදී තමා මත්කුඩු බොන හෝ විකුණන අයෙකු නොවන බව පොලිස් නිලධාරීන් වෙත දැනුම් දුන් බවත්, නිවසට පෙනෙන දුර තිබෙන නිසා නිවසට ගෝස් බිරිඳට දැනුම් දෙන ලෙස පොලිස් නිලධාරීන්ට ප්‍රකාශ කළද ඔවුන් ඊට කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා තමාට බැන වදිමින් තර්ජනය කරමින් පොලිස් ස්ථානය වෙත රැගෙන යන ලද බවත්, තමාට අසභ්‍ය වචනයෙන් බැනවැදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාට දැනුම් දී තම රැකියාව අහිමි කරන බවටද, මත්කුඩු පැකට් එකක් දමා 54 ගසා සිරගත කරන බවටද තර්ජනය කරමින් පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

එසේම, පේරාදෙණිය පොලිස් ස්ථානයට පැමිණි පසු තම බිරිඳට දුරකථයෙන් කතා කොට තමා පොලිස් අත්අඩංගුවට ගත් බව දැනුම් දුන් බවත්, ඉන් අනතුරුව තමාගෙන් විස්තර විමසා ඇඟිලි සළකුණු ලබාගත් බවත්, පසුව තමාට බස් රථයකින් නිවස වෙත යාමට රුපියල් එකසිය තිහ(රු.130/=) ක මුදලක් ලබා දී සටහන් පොතක අත්සන් කරවා ගත් බවත්, එදින එනම්, 2024.06.01 වන දින රාත්‍රී 8.25ට පමණ තමා පොලිස් ස්ථානයෙන් පිටත්කරන ලද බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. එලෙස කිසිදු හේතුවක් නොමැතිව තමා අත්අඩංගුවට ගෙන බියවද්දා පරුෂ වචනයෙන් බැන වැදී තමා බලවත් අපහසුතාවයට පත්කර තම පාසල් යන වයසේ දරුවන් තිදෙනා හා බිරිඳ ද විශාල කම්පනයකට ලක් කිරීම හේතුවෙන් තමා අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරීන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන ලෙසත්, තමාටද සාධාරණයක් ඉටු කර දෙන ලෙසත් පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

<u>1 වන වගඋත්තරකාර උ.පො.ප. කපුකොටුව යන අයගේ කරුණු දැක්වීම</u>

1 වන වගඋත්තරකාර උ.පො.ප. කපුකොටුව යන අය 2024.09.03 වන දින මෙම පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දී ඇත. එහිදී තමා 2004.04.18 දින උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස පොලිස් සේවයට බැඳී විවිධ ප්‍රදේශවල සේවය කර පේරාදෙණිය පොලිස් ස්ථානය වෙත 2022.02.15 වන දින ස්ථානමාරු ලබා පැමිණි බවත්, එහි දූෂණ මර්ධන අංශයේ

ස්ථානාධිපතිවරයා ලෙස සේවය කරන බවත් 1 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත. එසේම, 2024.06.01 දින වැටලීම් රාජකාරි සඳහා පේරාදෙණිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතේ පිටුව 294 සහ ඡේදය 06 යටතේ සටහන් යොදා පෙ.ව. 11.00ට පමණ පො.සැ. 19208 රුවන්, පො.සැ.31044 ජයතිලක සමඟ පො.කො.61314 කුලරත්න පැදවූ ඒබීවී 2015 දරණ ත්‍රීරෝද රථයෙන් තමා පොලිස් ස්ථානයෙන් පිටත් වූ බවත්, එලෙස පිටත්වීමෙන් පසු හෙරොයින් ළඟ තබා ගැනීමට අදාළ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන එදින පැය 15.00ට පොලිස් ස්ථානයට රැගෙනවිත් ස්ථානයට ඉදිරිපත් කර නැවත වැටලීම් රාජකාරී සඳහා පිටව යන ලද බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එසේම, තමා හා ඉහත කී නිලධාරීන් මහකන්ද ගල්ඔය ප්‍රදේශයට පිටත්ව ගොස් ගල්ඔය පාලම අසල සුමිත්‍රා මැණිකේ නැමැති මත්ද්‍රව්‍ය ජාවාරම්කාරියගේ නිවසට හැරෙන හන්දියේ සිට මීටර් තුනක් පමණ ගිය විට මාර්ගයෙන් ඇතුලට වන්නට ඇති පාලු නිවසක තාප්පය අසල සැඟවී සිටි බවත්, එසේ රැඳී සිටියේ ගම්පොල ප්‍රදේශයේ සිට හෙරොයින් මත්කුඩු රැගෙන එන බවට ලද තොරතුරක් පරීක්ෂා කිරීම සඳහා වන බවත්, එලෙස රැඳී සිටින විට උඩ පැත්තේ සිට පුද්ගලයෙකු (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) පැමිණ සුමිත්‍රා මැණිකේ යන අයගේ නිවසට ගමන්ගන්නා මාර්ගයට ඇතුළු වී වටපිට බලමින් විදුලි පන්දමක් දල්වා අවට නිරීක්ෂණය කිරීමට පටන් ගත් බවත්, එම අවස්ථාවේ එම ප්‍රදේශයේ වර්ෂාවක් හා දැඩි අඳුරු ස්වභාවයක් තිබූ අතර මෑතකාලීනව ගෙවල් බිඳුම් ඇතුළු සොරකම් කිහිපයක් එම ප්‍රදේශයේ සිදු වී තිබූ බැවින් එලෙස පැමිණි පුද්ගලයා පිළිබඳව සැකයක් ඇති වූ බවත්, එසේහෙයින් වැඩිදුර විමර්ශන සිදු කිරීම සඳහා මෙම පුද්ගලයා (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) සොරකමට සම්බන්ධව වරද කියා දී පැය 19.00ට අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ආ බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එසේ රැගෙනවිත් පැය 20.05ට පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ බවත්, ඔහුගෙන් ප්‍රශ්න කිරීමේ දී ඔහු අංක 5/412, ගලහා පාර, මහකන්ද, හිඳගල යන ලිපිනයේ පදිංචි බව හා අත්අඩංගුවට ගන්නා ලද ස්ථානයේ සිට මීටර් 100ක් පමණ දුරින් ඔහුගේ නිවස පිහිටා ඇති බව ප්‍රකාශ කළ බැවින් ඒ අසල පදිංචි තම පුද්ගලික ඔත්තුකරුවෙකු වෙත අංක 074-2120777 දරණ දුරකථන අංකයට ඇමතුමක් ලබාගෙන අත්අඩංගුවට ගත් පුද්ගලයා පිළිබඳව කරුණු තහවුරු කරගත් බවත්, ඔහු අවශ්‍ය කරන සැකකරුවෙකු ද යන්න තහවුරු කර ගැනීම සඳහා මහනුවර, දවුලගල සහ ගලහා යන පොලිස් ස්ථාන වෙත දුරකථන පණිවිඩ ලබාදුන් බවත්, වෙනත් වරදකට අවශ්‍යද යන්න තහවුරු කර ගැනීම සඳහා පොලිස් VPN ජාලයටද යොමු කළ බවත්, ඔහුගේ ඇඟිලි සටහන් ලබාගෙන ASS ජාලය වෙතද යොමු කර කරුණු තහවුරු කරගනු ලැබූ බවත්, එහිදී කිසිදු වරදකට සම්බන්ධ බවට තහවුරු නොවූ බැවින් අත්අඩංගුවට ගත් දිනම එනම්, 2024.06.01 වන දින පැය:20.25ට ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කර පැය:20.30ට ඔහුව ඇප මත මුදවා හරිනු ලැබූ බවත්, ඔහුට නිවසට යාම සඳහා ඔහුගේ අතෙහි මුදල් නොමැති වීම හේතුවෙන් තමා විසින් බසයේ යාම සඳහා රුපියල් එකසිය තිහ (රු.130/=)ක මුදලක් ලබා දුන් බවත්, ඊට අමතරව තම අංශයේ නිලධාරීන් සඳහා කෑමට රැගෙනවිත් තිබූ බනිසයක් හා

හයිලන්ඩ් වර්ගයේ කිරි පැකට් එකක් ඔහුට ලබාදීමද සිදුකළ බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

තවද, මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අංක AR 9240/24 යටතේ 2024.07.11 දින මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කරනු ලැබූ බවත්, තමා විසින් කිසිදු ද්වේශ සහගත අදහසකින් මෙම පුද්ගලයා (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) අත්අඩංගුවට නොගත් බවත්, එම ප්‍රදේශයේ පවතින තත්ත්වය අනුව එය පාලනය සඳහා මෙම ක්‍රියාමාර්ගය ගනු ලැබූ බවත් 1 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>2 වගඋත්තරකාර පො.සැ.37046 ජයතිලක යන අයගේ කරුණු දැක්වීම</u>

2 වගඋත්තරකාර පො.සැ.37046 ජයතිලක යන අය විසින් මෙම පැමිණිල්ලට අදාළව 2024.09.03 වන දින කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දී ඇත. ඒ අනුව තමා 1999 වර්ෂයේදී පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස පොලිස් සේවයට බැඳී 2019.01.01 සිට පොලිස් සැරයන් තනතුරට උසස්වීමක් ලැබූ බවත්, 2023.07.15 සිට පේරාදෙණිය පොලිස් ස්ථානයට අනුයුක්තව දූෂණ මර්ධන අංශයේ සේවයේ යෙදී සිටින බවත්, තමා 2024.06.01 දින පැය:11.00ට දූෂණ මර්ධන අංශයේ ස්ථානාධිපති උ.පො.ප. කපුකොටුව සහ පො.සැ.19208 රුවන් යන නිලධාරීන් සමඟ පො.කො.61317 කුලරත්න නිලධාරියා පදවන ලද එබීවී 2015 දරණ ත්‍රීරෝද රථයෙන් වැටලීම් රාජකාරි සඳහා පිටව ගොස් මත්ද්‍රව්‍ය ළඟ තබාගැනීම පිළිබඳ සැකපිට සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන පැය: 15.00ට ස්ථානයට රැගෙනවිත් භාරදී නැවත පැය 15.00ට පිටත්ව යන ලද බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එසේම, තමා ඇතුළු නිලධාරීන් මහකන්ද ගල්ඔය පාලම අසලට පැය 18.30ට පමණ යන ලද බවත්, හෙරොයින් මත්ද්‍රව්‍ය එම ස්ථානයට රැගෙන එන බවට පුද්ගලික ඔත්තුකරුවෙකු විසින් ස්ථානාධිපතිතුමා වෙත ලබා දෙන ලද තොරතුරක් මත එම ස්ථානයේ රැඳී සිටි බවත්, එලෙස රැඳී සිටියදී දොළුව දෙස සිට පුද්ගලයෙකු (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) විදුලි පන්දමක් ඇතැතිව එය දෙපසට එල්ල කරමින් තමා ඇතුළු නිලධාරීන් සිටි ස්ථානයට මදක් ආසන්නයට පැමිණ මත්කුඩු ජාවාරම් කරන සුමිත්‍රා මැණිකේ යන අයගේ නිවස පිහිටි මාර්ගයට හැරුණු බවත්, එසේ හැරී ඉදිරියට යනවාත් සමඟ ඔහුව තමා ඇතුළු නිලධාරීන් විසින් අල්ලා ගත් බවත්, එලෙස අල්ලා ගැනීමට හේතුව ඔහු විමසූ බවත්, “ඔහොම සද්ද නැතුව ඉන්න” යනුවෙන් තමා ඇතුළු නිලධාරීන් පැවසූ බවත්, ඔහුගේ අත්දෙකට මාංචු දැමූ බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, එම අවස්ථාවේ ඔහුගේ අතේ කිසිවක් නොතිබූ බවත්, එම පුද්ගලයාව අත්අඩංගුවට ගන්නා විට වේලාව පැය 19.00 පමණ වූ බවත්, පසුව තමා ඇතුළු නිලධාරීන් ගමන්ගත් ත්‍රීරෝද රථයේ නංවාගෙන ඔහුව පොලිස් ස්ථානයට රැගෙන ආ බවත්, එලෙස රැගෙනවිත් ඔහුගේ ප්‍රකාශයක් සටහන් කර අනන්‍යතාවය තහවුරු කරගෙන පොලිස් ඇප ලබාදුන් බවත්, පසුව මෙම අත්අඩංගුවට ගැනීම

සම්බන්ධයෙන් අංක AR 9240/24 යටතේ 2024.07.11 දින මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බවත්, තමා කිසිදු අයුරකින් ඔහු හට පරුෂ වචනයෙන් බැන වැදී නොමැති බවත් 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**3 වගඋත්තරකාර පො. සැ. 19208 රුවන් යන අයගේ කරුණු දැක්වීම**

3 වගඋත්තරකාර පො.සැ.19208 රුවන් යන අය විසින් මෙම පැමිණිල්ලට අදාළව 2025.02.13 වන දින කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දී ඇත. ඒ අනුව තමා 1995 වර්ෂයේදී පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස පොලිස් සේවයට බැඳුණු බවත්, විවිධ ප්‍රදේශවල සේවය කර 2023 නොවැම්බර් මස සිට පේරාදෙණිය පොලිස් ස්ථානයට අනුයුක්තව දූෂණ මර්ධන අංශයේ සේවයේ යෙදී සිටින බවත්, තමා 2024.06.01 දින පැය:11.00ට දූෂණ මර්ධන අංශයේ ස්ථානාධිපති උ.පො.ප. කපුකොටුව සහ පො.සැ.37046 ජයතිලක යන නිලධාරීන් සමඟ පො.කො.61317 කුලරත්න නිලධාරියා පදවන ලද ඒබීවී 2015 දරණ ත්‍රීරෝද රථයෙන් වැටලීම් රාජකාරි සඳහා පිටව ගොස් මත්ද්‍රව්‍ය ලඟ තබාගැනීම පිළිබඳ සැකපිට සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන පැය: 15.00ට ස්ථානයට රැගෙනවිත් භාරදී නැවත පැය 15.00ට පිටව යන ලද බවත් 3 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එසේම, තමා ඇතුළු නිලධාරීන් මහකන්ද ගල්ඔය පාලම අසලට පැය 18.20ට පමණ යන ලද බවත්, හෙරොයින් මත්ද්‍රව්‍ය එම ස්ථානයට රැගෙන එන බවට පුද්ගලික ඔත්තුකරුවෙකු විසින් ස්ථානාධිපතිතුමා වෙත ලබා දෙන ලද තොරතුරක් මත එම ස්ථානයේ රැඳී සිටි බවත්, එලෙස රැඳී සිටියදී දොළව දෙස සිට පුද්ගලයෙකු (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) විදුලි පන්දමක් ඇතැතිව එය අවට ගස් වලට එල්ල කරමින් තමා ඇතුළු නිලධාරීන් සිටි ස්ථානයට මදක් ආසන්නයට පැමිණ මත්කුඩු ජාවාරම් කරන සුමිත්‍රා යන අයගේ නිවස පිහිටි මාර්ගයට හැරුණු බවත්, එසේ හැරී ඉදිරියට යනවාත් සමඟ ඔහුව නිලධාරීන් විසින් අල්ලා ගත් බවත්, එවිට ඔහු අඹ ගස් බැලූ බව පැවසූ බවත්, ඔහු හට සිය අනන්‍යතාවය තහවුරු කිරීමට නොහැකි වූ බැවින් තමා ඇතුළු නිලධාරීන් විසින් ඔහුව සොරකමට සැක පිට අත්අඩංගුවට ගත් බවත් 3 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, තමා ඇතුළු නිලධාරීන් ගමන් ගත් ත්‍රීරෝද රථයේ නංවාගෙන එම පුද්ගලයා (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) පොලිස් ස්ථානයට රැගෙන ආ බවත්, එලෙස රැගෙනවිත් ඔහුගේ ප්‍රකාශයක් සටහන් කර අනන්‍යතාවය තහවුරු කරගෙන පොලිස් ඇප ලබාදුන් බවත්, පසුව මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අංක AR 9240/24 යටතේ 2024.07.11 දින මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බවත්, තමාහට මෙම පුද්ගලයා (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) සමඟ කිසිදු පෞද්ගලික අමනාපයක් නොමැති බවත් 3 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**4 වන වගඋත්තරකාර පේරාදෙණිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. ඩබ්.එම්.එස්.වී.බී. විජේකෝන් යන අයගේ කරුණු දැක්වීම.**

4 වන වගඋත්තරකාර පේරාදෙණිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. ඩබ්.එම්.එස්.වී.බී. විජේකෝන් යන අය විසින් අංක 4123/24 සහ 2024.07.08 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් මෙම පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2024.06.01 දින පේරාදෙනිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ ස්ථානාධිපති උ.පො.ප. කපුකොටුව, පො.සැ. 37046 ජයතිලක, පො.සැ. 19208 රුවන් සහ පො.කො. 61314 කුලරත්න, යන නිලධාරීන් සමඟින් වැටලීම් රාජකාරියෙහි යෙදී සිටියදී හල්ඔය පාලම අසලදී සැක කටයුතු පුද්ගලයකු (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) පරීක්ෂාවට ලක් කර ප්‍රශ්න කිරීමේදී ඔහුගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනයක් නොවූ හෙයින් වැඩිදුර විමර්ශන සිදු කිරීම සඳහා එම පුද්ගලයා වන ලංකා ආරච්චිගේ නුවන් චාමර ප්‍රේමදාස (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු), අංක 412/05, ගලහ පාර, මහකන්ද, හිඳගල, (වයස අවුරුදු 40) යන අය සොරකමට සැකපිට වරද කියා දී පැය 19.00ට අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කර ඇති බවත්, එම සැකකරුගෙන් ප්‍රශ්න කර ප්‍රකාශයක් සටහන් කර ඇති බවත්, ඔහුට එරෙහිව අපරාධයක් පිළිබඳ කරුණක් අනාවරණය නොවූ බැවින් 2024.06.01 දින පැය 20.30 ට ඇපමත මුදාහරින ලද බවත්, සැකකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මහනුවර ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත අංක AR 9240/2024 යටතේ කරුණු වාර්තා කිරීමට කටයුතු කර ඇති බවත් 4 වන වගඋත්තරකරු සිය වාර්තාව මගින් දක්වා ඇත.

**නිරීක්ෂණ**

2024.06.01 දින වැටලීම් රාජකාරී සඳහා පේරාදෙණිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතේ පිටුව 294 සහ ඡේදය 06 යටතේ සටහන් යොදා පෙ.ව. 11.00ට පමණ 1 වන වගඋත්තරකාර උ.පො.ප. කපුකොටුව, 2 වන වගඋත්තරකාර පො.සැ.37046 ජයතිලක සහ 3 වන වගඋත්තරකාර පො.සැ.19208 රුවන් යන වගඋත්තරකාර නිලධාරීන් පො.කො.61314 කුලරත්න නිලධාරියා පැදවූ ඒබීවී 2015 දරණ ත්‍රීරෝද රථයෙන් පොලිස් ස්ථානයෙන් පිටව ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, පේරාදෙණිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2024.06.01 දින පැය 20.05ට පිටුව 304 සහ ඡේදය 13 යටතේ යොදා ඇති සටහනෙහි නැවත මෙහෙයුම් රාජකාරි සඳහා පිටත්ව ගිය 1 වන වගඋත්තරකාර උ.පො.ප. කපුකොටුව, 2 වන වගඋත්තරකාර පො.සැ.37046 ජයතිලක සහ 3 වන වගඋත්තරකාර පො.සැ. 19208 රුවන් යන වගඋත්තරකාර නිලධාරීන් පො.කො. 61314 කුලරත්න නිලධාරියා පදවන ලද අංක ඒබීවී 2015 රථයෙන් ස්ථානයට පැමිණි බවත්, වැටලීම් රාජකාරි සඳහා සංචාරයේ යමින් හල්ඔය පාලම අසලදී සැක කටයුතු පුද්ගලයෙකු පරීක්ෂාවට ලක් කර ප්‍රශ්න කිරීමේදී ඔහුගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනයක් නොවූ බැවින් ද ප්‍රශ්න කිරීමේදී පරස්පර අදහස් ප්‍රකාශ සිදු කළ බැවින් ද

වැඩිදුර ප්‍රශ්න කිරීම සඳහා එකී පුද්ගලයා වූ පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය සොරකමට සැකපිට වරද කියා දී පැය 19.00ට අත්අඩංගුවට ගෙන ඇති බවත් සඳහන් කර ඇත.

පේරාදෙණිය පොලිස් ස්ථානයේ දූෂණ මර්දන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2024.06.01 දින පැය 20.25ට පිටුව 305 සහ ඡේදය 14 යටතේ යොදා ඇති සටහන අනුව පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය වෙතින් පහත පරිදි ප්‍රකාශයක් සටහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

"මා අංක 412/5, ගලහ පාර, මහකන්ද, හිඳගල ලිපිනයේ මගේ නෝනයි බබාලා තුන් දෙනෙක් එක්ක තමයි ජීවත් වෙන්නේ. මම ගස් නැගලා තමයි ජීවත් වෙන්නේ. මම ශාරීරික අධ්‍යාපන අංශයේ තමයි වැඩ කරන්නේ කැම්පස් එකේ. මම අද රෑ වෙලා ගෙදර යන්න යන කොට ගල්ඔය පාලම ළඟදි පොලිසියේ මහත්තුරු කණ්ඩායමක් ඇවිත් මාව චෙක් කරලා මගේ හැඳුනුම්පත නැහැ කියලා මාව පොලීසියට අල්ලාගෙන ආවා. මට පොලීසියට විරුද්ධව කියන්න කිසිම දෙයක් නැහැ. මට කීමට ඇත්තේ එපමණයි."

තවද, පේරාදෙණිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2024.06.01 දින පැය 20.30ට පිටුව 306 සහ ඡේදය 15 යටතේ යොදා ඇති සටහන අනුව පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය පුද්ගලික ඇප මත මුදා හැර ඇති බව පෙනී යයි.

ඉහත කී පොලිස් සටහන් අනුව පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය 2024.06.01 වන දින පැය 19.00ට පමණ ඔහුගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනයක් නොවූ බැවින් ද ප්‍රශ්න කිරීමේදී පරස්පර අදහස් ප්‍රකාශ කළ බැවින් ද සොරකමට සැකපිට අත්අඩංගුවට ගෙන ඇති බවත්, එදිනම පැය 20.30ට පුද්ගලික ඇප මත මුදා හැර ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ 2024.06.01 වන දින රාත්‍රී ආහාරය පිළියෙළ කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට ප.ව. 6.15ට පමණ නිවසට ආසන්නයේ ඇති කඩයට ගිය බවත්, කඩයට ගොස් නැවත නිවස කරා එමින් සිටියදී 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් තමාව අත්අඩංගුවට ගත් බවත්, එම අවස්ථාවේ දී තමා කඩයෙන් මිලදී ගත් පරිප්පු ග්‍රෑම් 250 හා මාරි බිස්කට් පැකට් එක පෙන්වා තමා කඩයට ගොස් පැමිණි බව පොලිස් නිලධාරීන් වෙත පැවසුවද, ඔවුන් ඒ පිළිබඳව කිසිදු අවධානයක් යොමු නොකර තමා පොලිස් ස්ථානය වෙත රැගෙන යන ලද බවත් ය.

වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ප්‍රකාශයන් සලතා බැලීමේ දී 1 වගඋත්තරකාර උ.පො.ප. කපුකොටුව යන අය සඳහන් කරනුයේ පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය සොරකමකට සම්බන්ධව වරද කියාදී අත්අඩංගුවටගත් බවයි. 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇත්තේ පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය මත්කුඩු ජාවාරම් කරන සුමිත්‍රා මැණිකේ නැමැති අයගේ නිවසට යන මාර්ගයේ සැකකටයුතු ලෙස හැසිරුණු බැවින් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ආ බවයි. ඒ අනුව පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය අත්අඩංගුවට ගැනීමට අදාළ හේතුව සම්බන්ධයෙන් 1 වන, 2 වන

සහ 3 වන වගඋත්තරකරුවන් විසින් එකිනෙකට වෙනස් කරුණු ඉදිරිපත් කර ඇති බව පෙනී යයි. කෙසේවෙතත් පේරාදෙණිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2024.06.01 දින පැය 20.05ට පිටුව 304 සහ ඡේදය 13 යටතේ යොදා ඇති සටහන අනුව පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය, ඔහුගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනයක් නොතිබූ බැවින් සහ ප්‍රශ්න කිරීමේදී පරස්පර අදහස් ප්‍රකාශ කළ බැවින් සොරකමට සැකපිට අත්අඩංගුවට ගෙන ඇති බවට සටහන් යොදා ඇත.

පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය වෙත අංක AR 9240/2024 යටතේ 2024.07.11 වන දින 4 වන වගඋත්තරකරු විසින් කරුණු වාර්තා කර ඇති අතර, එහිදී සඳහන් කර ඇත්තේ පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය සැකපිට අත්අඩංගුවටගෙන ඇප මත මුදා හැර ඇති බවයි.

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(1) වගන්තිය මගින් වරෙන්තුවක් නොමැතිව පුද්ගලයින් අත්අඩංගුවට ගත හැකි අවස්ථා දක්වා ඇති අතර 32(1)(ආ) වගන්තිය ප්‍රකාරව යම් සංඥෙය වරදකට සම්බන්ධ වූ තැනැත්තකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකු සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතී ද එවැනි යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකි බව සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ලට අදාළව සලකා බැලීමේ දී පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අයට එරෙහිව යම් සංඥෙය වරදකට සම්බන්ධ බවට සාධාරණ පැමිණිල්ලක් හෝ විශ්වාස කටයුතු තොරතුරක් ලැබී නොතිබූ බව වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම් අනුව අනාවරණය වී ඇත. වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ එම අවස්ථාවේ දී පැමිණිලිකරු හට සිය අනන්‍යතාවය තහවුරු කිරීමට නොහැකි වීම හේතුවෙන් ඔවුන්හට ඇති වූ සැකය මත බවට දක්වා ඇති බැවින් ඉහත කී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(1) වගන්තිය අනුව එය පැමිණිලිකරු විසින් යම් සංඥෙය වරදකට සම්බන්ධ වූ තැනැත්තකු බවට වන සාධාරණ සැකයක් විය යුතු ය.

1 වන වගඋත්තරකාර උ.පො.ප. කපුකොටුව යන නිලධාරියා විසින් 2024.09.03 වන දින කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අයව පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමෙන් අනතුරුව සිදු කරන ලද ප්‍රශ්න කිරීම් වලදී ඔහු අංක 5/412, ගලහා පාර, මහකන්ද, හිඳගල යන ලිපිනයේ පදිංචි බව හා අත්අඩංගුවට ගන්නා ලද ස්ථානයේ සිට මීටර් 100 ක් පමණ දුරින් ඔහුගේ නිවස පිහිටා ඇති බව ප්‍රකාශ කළ බැවින් ඒ අසල පදිංචි තම පුද්ගලික ඔත්තුකරුවෙකු වෙත අංක 074-2120777 දරණ දුරකථන අංකයට ඇමතුමක් ලබාගෙන අත්අඩංගුවට ගත් පැමිණිලිකරුගේ අනන්‍යතාවය පිළිබඳව කරුණු තහවුරු කරගත් බවයි. ඒ අනුව වගඋත්තරකාර

පාර්ශවය විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ ඔහුගේ අනන්‍යතාවය තහවුරු කිරීමට නොහැකි වීම හේතුවෙන් ඔවුන්හට ඇති වූ සැකය මත වන බැවින්, පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමෙන් තොරව ඉහතින් සඳහන් කර ඇති පරිදි 1 වන වගඋත්තරකරු හට සිය පුද්ගලික ඔත්තුකරු වෙත දුරකථන ඇමතුමක් ලබා දී පැමිණිලිකරුව පොලිස් නිලධාරීන් හට හමු වූ ස්ථානයේ දීම ඔහුගේ අනන්‍යතාවය තහවුරු කරගත හැකිව තිබූ බව නිරීක්ෂණය වේ.

එසේම, පැමිණිලිකරු විදුලි පන්දමක් දල්වාගෙන එය දෙපසට එල්ල කරමින් අවට නිරීක්ෂණය කරමින් පැමිණි බවත්, වගඋත්තරකාර පාර්ශවය වැටලීම් රාජකාරියෙහි යෙදී සිටි ස්ථානය ආසන්නයේ ඇති මත්කුඩු ජාවාරම් කරන සුමිත්‍රා මැණිකේ යන අයගේ නිවස පිහිටි මාර්ගයට හැරී ගමන් ගත් බවත් 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇත. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ තමා එම අවස්ථාවේදී තම නිවස ආසන්නයේ පිහිටි කඩයට ගොස් විදුලි පන්දම ද දල්වාගෙන නැවත නිවස වෙත පැමිණෙමින් සිටි බවයි. දෙපාර්ශවයේ කරුණු දැක්වීම් අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ 2024.06.01 වන දින පැය 19.00ට පමණ ය. එම අවස්ථාවේ දී අදාළ ප්‍රදේශයේ වර්ෂාවක් සහ දැඩි අඳුරු ස්වභාවයක් පැවති බව වගඋත්තරකාර පාර්ශවය විසින්ම සඳහන් කර ඇති බැවින් පැමිණිලිකරු විදුලි පන්දමක් දල්වාගෙන අවට නිරීක්ෂණය කරමින් මාර්ගයේ ගමන් කිරීම, පැමිණිලිකරු සොරකමකට සම්බන්ධ වූ අයෙකු බවට සැක කිරීමට ප්‍රමාණවත් වන සාධාරණ හේතුවක් නොවන බව නිරීක්ෂණය වේ. එසේම, පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී ඔහු සන්තකයේ සොරකම් කරන ලද භාණ්ඩයක් හෝ සොරකමක් සිදු කිරීමට යොදා ගත හැකි බවට සැක කළ හැකි වෙනත් උපකරණයක් හෝ තිබී හමු වූ බවට වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත. එසේම, පේරාදෙණිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2024.06.01 දින පැය 20.20ට පිටුව 304 සහ ඡේදය 13 යටතේ උපසේවක පො.සැ. 56612 සරත් නිලධාරියා විසින් සටහන් කර ඇත්තේ පැමිණිලිකරු සතුව කිසිදු දේපළක් නොමැති බවයි. ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන අවස්ථාවේ දී ඔහු සතුව කිසිදු සැක කටයුතු දේපළක් තිබී නොමැති බව අනාවරණය වේ.

එසේම, පැමිණිලිකරු, මත්කුඩු ජාවාරම් කරන සුමිත්‍රා මැණිකේ යන අයගේ නිවස පිහිටි මාර්ගයේ ගමන් කරමින් සිටියදී අත්අඩංගුවට පත්ව ඇති අතර, එම ස්ථානයේ සිට මීටර් 100ක් දුරින් ඔහුගේ නිවස පිහිටා ඇති බවට 1 වන වගඋත්තරකරු සිය පුද්ගලික ඔත්තුකරු මාර්ගයෙන් තහවුරු කරගෙන ඇති බැවින් පැමිණිලිකරු අදාළ මාර්ගයේ ගමන් කර ඇත්තේ ඔහුගේ නිවසට යාමට බවට පැමිණිලිකරු විසින් සිදු කර ඇති ප්‍රකාශය පිළිගත හැකි බව නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ ඔහු අත්අඩංගුවට පත්වන වේලාවේදී ඔහු සිය නිවස ආසන්නයේ පිහිටි කඩයට ගොස් නැවත එමින් සිටි බවත්, කඩයෙන් මිලදී ගත් ද්‍රව්‍ය ද පෙන්වමින් ඒ බව පොලිස් නිලධාරීන්ට පැවසුව ද ඔවුන් ඒ පිළිබඳව කිසිදු අවධානයක් යොමු නොකළ බවත් ය. නො.299/බී, ගල්ඔය, හිඳගල ලිපිනයේ පදිංචි ආර්.එම්. පොඩි අප්පුහාමි යන අය විසින් 2024.08.09 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ,

පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය 2024.06.01 වන දින ප.ව. 6.45-7.00 අතර සිය කඩයට පැමිණි බවත්, ඔහු විසින් පරිප්පු ග්‍රෑම් 250ක්, රතුපාට කවරයෙන් ආවරණය වූ මාරි බිස්කට් පැකට් එකක් හා රුපියල් 20ක බුලත් තම කඩයෙන් මිලට ගෙන ගිය බවත්, එලෙස යන අතරතුර දී පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය මත්කුඩු විකුණන නිවසකට යමින් සිටි බවට වූ සැකය මත පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත් බව දැනගන්නට ලැබුණු බවත්, පැමිණිලිකාර එල්.ඒ. නුවන් චාමර ප්‍රේමදාස යන අය මත්කුඩු අල්ලන තබා දැක හෝ නොමැති තැනැත්තෙකු බව තමා ඉතා මැනවින් දන්නා බවත් ය. ඒ අනුව 2024.06.01 වන දින පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන වේලාවේදී ඔහු සිය නිවස ආසන්නයේ පිහිටි කඩයට ගොස් නැවත නිවස වෙත එමින් සිටි බවට පැමිණිලිකරු විසින් සිදු කර ඇති ප්‍රකාශය පිළිගත හැකි බව නිරීක්ෂණය වේ.

තවද, වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමෙන් අනතුරුව පැමිණිලිකරු යම් වරදකට සම්බන්ධ තැනැත්තෙකු ද යන්න ඔහුගේ ඇඟිලි සලකුණු ආදිය ලබාගනිමින්  විවිධ පොලිස් තොරතුරු ජාල ඔස්සේ පරීක්ෂා කර ඇති අතර, ඔහු අවශ්‍ය කරන සැකකරුවෙකු ද යන්න තහවුරු කර ගැනීම සඳහා මහනුවර, දවුලගල සහ ගලහා යන පොලිස් ස්ථාන වෙත දුරකථන පණිවිඩ ද ලබාදී ඇත. එහිදී පැමිණිලිකරු අවශ්‍ය කරන සැකකරුවෙකු නොවන බව සහ කිසිදු වරදකට සම්බන්ධ නොමැති බව තහවුරු වූ බැවින් ඔහු ඇප මත නිදහස් කළ බව වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකරු වරදක් සිදු කරන ලද පුද්ගලයෙකු නොවන බව පැහැදිලි වේ.

පේරාදෙණිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2024.06.01 දින පැය 20.05ට පිටුව 304 සහ ඡේදය 13 යටතේ යොදා ඇති සටහනෙහි 1 වන වගඋත්තරකාර උ.පො.ප. කපුකොටුව නිලධාරියා විසින් සඳහන් කර ඇත්තේ පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කිරීමේ දී ඔහුගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනයක් නොවූ බවත්, ප්‍රශ්න කිරීමේදී පරස්පර අදහස් ප්‍රකාශ සිදු කළ බවත් ය. කෙසේවෙතත් ඉහතින් සඳහන් කර ඇති පරිදි පැමිණිලිකරු පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමෙන් අනතුරුව ඔහුගෙන් සිදු කළ ප්‍රශ්න කිරීමේ දී ලබා දුන් තොරතුරු මත පෞද්ගලික ඔත්තුකරුවෙකු මගින් පැමිණිලිකරුගේ අනන්‍යතාවය තහවුරු කරගෙන ඇත. ඉහතින් සඳහන් කර ඇති පරිදි වගඋත්තරකාර පාර්ශවය විසින් විවිධ පොලිස් ස්ථාන වලින් සිදු කළ විමසීමේ දී සහ පොලිස් තොරතුරු ජාල ඔස්සේ සිදු කළ පරීක්ෂාවන් වලදී පැමිණිලිකරු කිසිදු වරදකට සම්බන්ධ අයෙකු නොවන බව අනාවරණය වී ඇත. එවැනි පසුබිමක් තුළ පැමිණිලිකරු හට සිය අනන්‍යතාවය හෙළි නොකර සිටීමට හේතුවක් පැවති බව නිරීක්ෂණය නොවේ. එසේ හෙයින් පැමිණිලිකරුගෙන් සිදු කළ ප්‍රශ්න කිරීම් වලදී ඔහු පරස්පර අදහස් ප්‍රකාශ කරමින් සිය අනන්‍යතාවය හෙළිදරව් නොකළ බවට වගඋත්තරකාර පාර්ශවය සිදු කර ඇති ප්‍රකාශයන්ට වඩා, පැමිණිලිකරු අත්අඩංගුවට ගත් අවස්ථාවේ දී ඔහු විසින් සිය අනන්‍යතාවය සහ ඒ වේලාවේදී එම ස්ථානයෙන් ගමන් කිරීමට හේතුව සම්බන්ධයෙන් ප්‍රකාශ කළ කරුණු පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය විසින් නිසි අවධානයක් යොමු

නොකොට ඔහුව පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවට සිදු කර ඇති ප්‍රකාශය පිළිගැනීමේ වැඩි සම්භාවිතාවයක් ඇති බව නිරීක්ෂණය වේ.

එසේහෙයින් වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට පෙර නිසි පරිදි විමර්ශනයක් සිදු කරනු ලැබුවේ නම් පැමිණිලිකරුගේ අනන්‍යතාවය, එම අවස්ථාවේ දී ඔහු එකී මාර්ගයේ ගමන් කිරීමට හේතු වූ කරුණු සහ ඔහු විසින් සිදු කරන ලද ප්‍රකාශයන්හි සත්‍යතාවය තහවුරු කරගත හැකිව තිබූ බව ද නිරීක්ෂණය වේ.

නිගමනය

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(1) වගන්තිය මගින් වරෙන්තුවක් නොමැතිව පුද්ගලයින් අත්අඩංගුවට ගත හැකි අවස්ථා දක්වා ඇති අතර 32(1)(ආ) වගන්තිය ප්‍රකාරව යම් සංඥෙය වරදකට සම්බන්ධ වූ තැනැත්තකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකු සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතී ද එවැනි යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකි බව සඳහන් කර ඇත. ඉහත දක්වන ලද කරුණු අනුව සලකා බැලීමේ දී පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන්හට පැමිණිලිකරුට එරෙහිව සාධාරණ පැමිණිල්ලක්, විශ්වාස කටයුතු තොරතුරක් හෝ සාධාරණ සැකයක් පැවතී නොමැති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන අවස්ථාවේ දී ඔහුගේ නිවස ආසන්නයේ පිහිටි කඩයකට ගොස් නැවත පැමිණෙමින් සිට ඇති බව එකී කඩයෙහි හිමිකරු වන නො.299/බී, ගල්ඔය, හිඳගල ලිපිනයේ පදිංචි ආර්.එම්. පොඩි අප්පුහාමි යන අය විසින් 2024.08.09 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය අනුව තහවුරු වේ. පැමිණිලිකරු එලෙස පැමිණීමේ දී විදුලි පන්දමක් දල්වාගෙන අවට නිරීක්ෂණය කරමින් පැමිණි බව වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇති අතර, එම අවස්ථාවේ දී එකී ප්‍රදේශයේ දැඩි අඳුරු ස්වභාවයක් පැවති බව වගඋත්තරකාර පාර්ශවය විසින්ම සඳහන් කර ඇත. එබැවින් එලෙස අඳුරු ස්වභාවයක් පැවතීම, පැමිණිලිකරු ගමන් කර ඇත්තේ සිය නිවස පිහිටි මාර්ගයේ වීම, ඔහු සන්තකයේ කිසිදු සැක කටයුතු දේපළක් නොවීම, තම නිවස ආසන්නයේ පා ගමනින් යා හැකි දුරකින් පිහිටා ඇති කඩයකට යාමේදී පුද්ගලයෙකු සිය අනන්‍යතාවය තහවුරු කළ හැකි ලේඛන වන ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය, විදේශ ගමන් බලපත්‍රය වැනි ලේඛන රැගෙන යාම සාධාරණ ලෙස අපේක්ෂා කළ නොහැකි වීම යන කරුණු මත පැමිණිලිකරු එම අවස්ථාවේදී විදුලි පන්දමක් දල්වාගෙන පැමිණීමත් ඔහු සතුව සිය අනන්‍යතාවය තහවුරු කළ හැකි ලේඛනයක් නොතිබීමත්, ඔහුව සොරකමකට සැකපිට අත්අඩංගුවට ගැනීමට සාධාරණ සැකයක් ඇති වීමට ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වේ.

ලන්දගේ ඉෂාරා අංජලී සහ විජේසිංහ චූලංගනී එදිරිව වරුණී බෝගහවත්ත සහ වෙනත් අය (SCFR 677/2012) නඩුවේදී, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව අනුව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් නිදහස් වන අතර, යම් හෙයකින් නිදහස අහිමි කරන්නේ නම් නීතියෙන් ස්ථාපිත කර ඇති ක්‍රියාපටිපාටිය දැඩි ලෙස අනුගමනය කළ යුතු බවට නියෝග කරයි. මෙම ක්‍රියාපටිපාටියේ විධිවිධාන සකසා ඇත්තේ අභිමතය පරිදි හෝ අත්නෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම වැළැක්වීට සහ පුද්ගල වාසි සහ දේශපාලන අරමුණු සඳහා අධිකරණ බලය අයුතු ලෙස භාවිත කිරීම වැළැක්වීමට බව දක්වා ඇත.

එසේම, කපුගීකියනගේ එදිරිව හෙට්ටිආරච්චි සහ වෙනත් අය (1984) 2 Sri L.R. 153 නඩුවේදී යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමේදී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි සඳහන් නීතිය මගින් ස්ථාපිත කරන ලද ක්‍රියාපටිපාටිය හැර වෙනත් ක්‍රියාපටිපාටියක් යොදාගත නොහැකි බව සඳහන් කර ඇත.

ඒ අනුව පැමිණිලිකරුව සොරකමට සැකපිට අත්අඩංගුවට ගනු ලැබූ බව වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කළ ද, පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන අවස්ථාවේ දී ඔහු පිළිබඳව සාධාරණ සැකයක් ඇති කරගැනීමට කරුණු පැවති බව නිරීක්ෂණය නොවන බැවින් ඉහත කී නඩු තීරණයන් තුළින් ද දක්වා ඇති පරිදි යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමේදී අනුගමනය කළ යුතු 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි සඳහන් නීතිය මගින් ස්ථාපිත කරන ලද ක්‍රියාපටිපාටිය වගඋත්තරකාර පාර්ශවය විසින් අනුගමනය කර නොමැති බව තහවුරු වේ. එසේහෙයින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකාර උ.පො.ප. කපුකොටුව, 2 වන වගඋත්තරකාර පො.සැ.37046 ජයතිලක සහ 3 වන වගඋත්තරකාර පො. සැ.19208 රුවන් යන වගඋත්තරකාර නිලධාරීන් විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට ස්ථානාධිපතිවරයා විෂයෙහි වගකීමක් පවතින බවත්, එසේ කටයුතු නොකළහොත් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම කඩ කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බැඳෙන බවත් **මොහොමඩ් රෂීඩ් ෆාතිමා ෂර්මිලා එදිරිව පො.සැ. 31118 කේ.ඩබ්.ජී. නිශාන්ත සහ තවත් අය (SC FR Application No. 398/2008)** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකාර නිලධාරීන් විසින් පැමිණිලිකරුට එරෙහිව සාධාරණ පැමිණිල්ලක්, විශ්වාස කටයුතු තොරතුරක් හෝ සාධාරණ සැකයක් නොමැතිව ඔහුව අත්අඩංගුවට ගෙන ඇති අතර, පේරාදෙණිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2024.06.01 දින පැය 20.20ට පිටුව 304 සහ ඡේදය 13 යටතේ උපසේවක පො.සැ. 56612 සරත් නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව පැමිණිලිකරුව පොලිස් ස්ථානයට රැගෙන ඒමෙන් අනතුරුව ස්ථානාධිපතිතුමාගේ නියෝග ලැබෙනතෙක් පොලිස් ස්ථානයේ සිර මැදිරියේ රඳවා තබා ඇත. 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකාර නිලධාරීන් විසින් අදාළ වැටලීම් රාජකාරී සඳහා පොලිස් ස්ථානයෙන් පිටත්ව ගොස් ඇත්තේ 4 වන වගඋත්තරකාර ස්ථානාධිපතිවරයාගේ නියෝග මත වන බැවින් තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුකූලව ක්‍රියා කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීමේ වගකීම 4 වන වගඋත්තරකාර ස්ථානාධිපතිවරයා සතු ය. 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකාර නිලධාරීන් විසින් එලෙස නිසි විමර්ශනයකින් තොරව කිසිදු සාධාරණ පැමිණිල්ලක්, විශ්වාස කටයුතු තොරතුරක් හෝ සාධාරණ සැකයක් නොමැතිව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ඒම සහ කිසිදු වරදක් සිදු කර නොමැති පැමිණිලිකරු ස්ථානාධිපතිගේ නියෝග ලැබෙනතෙක් සිර මැදිරියේ රඳවා තැබීම නීතියට අනුකූල නොවේ. ඒ අනුව 4 වන වගඋත්තරකාර ස්ථානාධිපතිවරයා සිය අධීක්ෂණ වගකීම නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය වේ. එසේහෙයින් ඉහත කී නඩු තීරණය තුළින් ද දක්වා ඇති පරිදි 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 4 වන වගඋත්තරකරු විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

1. 1 වන වගඋත්තරකාර උ.පො.ප. කපුකොටුව නිලධාරියා විසින් රුපියල් දසදහස (රු.10,000/-)ක මුදලක් ද, 2 වන වගඋත්තරකාර පො.සැ.37046 ජයතිලක සහ 3 වන වගඋත්තරකාර පො. සැ.19208 රුවන් යන නිලධාරීන් විසින් එක් අයෙකුගෙන් රුපියල් හත්දහස් පන්සියය (රු.7,500/-)ක මුදලක් බැගින් රුපියල් පහළොස්දහස (රු.15,000/-)ක මුදලක් ද වශයෙන් රුපියල් විසිපන්දහස (රු.25,000/-)ක මුදලක් පැමිණිලිකරු වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

2. 1 වන, 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2026. 04 . 29 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් සහ පොලිස්පතිවරයා වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.